# වලාණේ පත්තිනි දේව ඇදහිල්ල පිළිබඳ අධ්‍යයනයක්

කුසුම් හේරත්
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ශ්‍රී ලංකාවේ ජන ඇදහිලි අතර ප්‍රමුඛත්වය හිමි වන්නේ දේව ඇදහිල්ලට ය. මෙරට ඇදහිල්ලට පාත්‍ර වන දෙවිවරුන් අතර දෙවඟනන් ද සිටින බව ප්‍රකට ය. බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල විවිධ හේතු මුල් කොට ගෙන දෙවඟනන් පුදනු ලබන බව ඒ පිළිබඳ තොරතුරු විමසන විට අනාවරණය වේ. දෙවඟනන් අතර විශේෂ ස්ථානයක් හිමි කර ගෙන ඇත්තේ පත්තිනි දෙවඟනයි. පත්තිනි දේව උත්පත්තිය ගැන විමසීමේ දී සත් වාරයක්, සත් අයුරකින් උපන් හෙයින් සත් පත්තිනි යන නම ලැබී ඇති බවට තොරතුරු ජනප්‍රවාදයේ පවතී. එම සත් පත්තිනි දෙවඟනන්ගෙන් කෙනෙකු ලෙස සැලකෙන වලාණේ පත්තතිනි දෙවඟන ඇදහීම වයඹ පළාතේ නිකවැරටිය ප්‍රදේශයේ ප්‍රධාන දේවාල දෙකක් ආශ්‍රිත ව සිදු කෙරේ. මේ ප්‍රදේශයේ ගැමි ජනතාවගේ අදහස අනුව මෙකී දෙවඟන පත්තිනි දෙවඟනගේ එක් අවස්ථාවක් වශයෙන් සැලකුණ ද උත්පත්ති කතාව ආශ්‍රිත තොරතුරු විමසන විට වලාණේ පත්තිනි දේශීය අනන්‍යතාවකින් යුත් ලාංකේය දෙවඟනක් වශයෙන් සැලකීමට හැකි ය. එහෙත් ඒ ගැන ලිඛිත සාධක කිසිදු මූලාශ්‍ර ග්‍රන්ථයක සඳහන් නො වේ. මෙම දෙවඟන වෙනුවෙන් කැප වූ දේවාල දෙකකි. එනම් කුරුණෑගල පුත්තලම් පාරේ කොටවෙහෙරින් හැරී මීවැල්ලෑව මාර්ගයේ සැතපුම් 1 ක් පමණ ගිය විට කොටවෙහෙර රජමහා විහාරස්ථානයේ පිහිටි දේවාලයත්, වාරියපොල කටුපොතින් මුණාමල්දෙණිය පාරේ සැ. 2 ක් පමණ ගිය විට හමු වන තිස්සව රජමහා විහාරස්ථානයේ තිස්සව පර්වතය ආශ්‍රිත දේවාලයත් ය.

වලාණේ පත්තිනි උපත හා සම්බන්ධ තොරතුරු අතර ඊට අදාළ උත්පත්ති කවි ද ජනප්‍රවාදයේ ප්‍රචලිතව පවතී. ඒ දේවාලයන්හි සේවයෙහි නියුතු කපු මහතුන් විශ්වාස කරන අන්දමට මෙම දේව ඇදහිල්ල පරම්පරා හැට නමයක් තිස්සේ පැවත එයි. දළ වශයෙන් එය සියවස් දහයක් පමණ වෙතැයි සිතිය හැකිය.

ජනප්‍රවාදයේ එන තොරතුරුවලට අනුව වලාණේ බණ්ඩාර පෙළපතට අයත් මනුෂ්‍ය දුවක් වලාණේ පත්තිනි දෙවඟන බවට පත්වූ බව පැහැදිලිව ධ්වනිත වේ.

වලාණේ පත්තිනි දෙවඟන ඇදහීම සිදු කෙරෙන්නේ විශේෂ කාරණා තුනක් මුල් කර ගෙන ය. එනම්, දරුවන් නොමැති කාන්තාවන්ට දරුවන් ලබා දීම, ගර්භනී කාන්තාවන්ගේ දරුගැබ් ආරක්ෂා කර දීම හා උපන් දරුවන් රෝගාබාධ, උවදුරු හා බාලගිරි දෝෂයන්ගෙන් ආරක්ෂා කර දීමය.

එමෙන් ම වලාණේ පත්තිනියට බාරහාර වීමේ දී හා ඒ බාර ඔප්පු කිරීමේ දී අනෙක් දෙවි දේවතාවුන්ට වඩා වෙනස් වූ චාරිත්‍ර විධි අනුගමනය කෙරෙන බව ද පෙනේ. වසරක් පාසා වලාණේ පත්තිනි දෙවඟන උදෙසා පවත්වන පුද පූජා රටාවෙහි ඉස්මතු වී පෙනෙන වෙනසක් වන්නේ එහි දක්නට ලැබෙන බෞද්ධ ලක්ෂණ ය.

මානව විද්‍යාවට හා සමය සමාජ විද්‍යාවට අනුව සමාජ ඛණ්ඩායමක හෝ ප්‍රදේශයක බලය හිමි කරගෙන සිටි පුද්ගලයෙකු මරණින් මතු දේවත්වයට පත් කොට පුද පූජා කිරීම හා ආරක්ෂාව පැතීමේ අපේක්ෂාව මෙම ඇදහිල්ලෙන් ප්‍රකට වන අතර මෙය පත්තිනි ඇදහිල්ලේ ලාංකීය දිගුවක් ලෙස සැලකිය හැකි ය.